# සර්වාස්තිවාද අභිධර්මයේ සංවර්ධනය පිළිබඳ ලුහුඬු විවරණයක්

මිරිස්වත්තේ විමලඤාණ හිමි

මෙම ලිපියෙහි සර්වාස්තිවාදී සම්ප්‍රදායේ අභිධර්ම සාහිත්‍යය සකස් වූ අයුරු විමර්ශනය කෙරේ. ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක්වන්නේ සර්වාස්තිවාදී අභිධර්ම පිටකයට අයත් සප්ත ග්‍රන්ථයි. සර්වාස්තිවාද අභිධර්ම සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පිළිබඳ මෙන්ම අභිධර්මපිටකාගත ග්‍රන්ථ ඇසුරින් සර්වාස්තිවාද අභිධර්ම සාහිත්‍යය සංවර්ධනය වූ ආකාරය පිළිබඳ විමර්ශනයක් ලිපියෙහි අන්තර්ගතයි.

## සර්වාස්තිවාදීන්ගේ අභිධර්ම සාහිත්‍යය හඳුනාගැනීම

තුන්වැනි ධර්ම සංගායනාවට පෙර මුල් ථෙරවාද සම්ප්‍රදායෙන් බිඳී ගිය සර්වාස්තිවාද සම්ප්‍රදාය දීප්තිමත් වූයේ කාෂ්මීරයේ බව අවිවාදයෙන් පිළිගැනේ. සර්වාස්තිවාද සම්ප්‍රදායේ වැදගත් කෘති සියල්ලම පාහේ කාෂ්මීරයේ රචනාවූ බවට සාක්ෂි තිබේ. බෙහෙවින් ජනප්‍රිය වූ සර්වාස්තිවාද සම්ප්‍රදායේ අදහස් ඊළඟ සියවස්වල භාරතයේ ඒ ඒ ප්‍රදේශවල ජනප්‍රිය විය. චීන දේශාටක වාර්තා (Takakusu, 1905: 70-71) අධ්‍යයනය කිරීමේ දී පෙනෙන පරිදි ඒ ඒ වකවානුවල මෙම සම්ප්‍රදාය භාරතයේ විවිධ ප්‍රදේශයන්හි අත්කරගෙන තිබූ ජනප්‍රිය භාවය සලකා බැලීමේ දී අනෙක් සියලුම සම්ප්‍රදායන්ට වඩා එහි භූගෝලීය ව්‍යාප්තිය පුලුල්ව පැවති බව පෙනේ (Takakusu, 1905: 70). එක් අතකින් භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වන අතර මෙම සම්ප්‍රදාය බෞද්ධ දර්ශන සම්ප්‍රදායන්හි ඉතා වැදගත් සම්ප්‍රදායක් ලෙස භාරතය තුළ ස්වකීය අනන්‍යතාව මැනවින් තහවුරු කරගෙන තිබූ බවට කිසිදු විවාදයක් නැත. බෞද්ධ දර්ශන සම්ප්‍රදායන් විසින් බිහි කළ අති විශිෂ්ට කෘති අතර අග්‍රගන්‍ය කෘතියන් වශයෙන් පිළිගත යුතු නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමිකකාරිකාව ප්‍රතිපක්ෂ වන බෞද්ධ දර්ශනය නියත වශයෙන්ම සර්වාස්තිවාදී සම්ප්‍රදායයි. තාර්කික වශයෙන් සර්වාස්තිවාදී මතයට තදබල අභියෝගයක් මූලමාධ්‍යමාකකාරිකාව මඟින් එල්ල කරනු ලැබ ඇතත් මෙහිදී අපගේ අවධානයට යොමුවන කරුණ නම් අභිමානවත් බෞද්ධ තාර්කිකයාගේ වධානය යොමු කර ගැනීමට තරම් සර්වාස්තිවාදී අදහස් කෙතරම් බලවත්ව පැවතියේද යන්නයි. එමණක් නොව ක්‍රි. ව. 8 වැනි සියවසේ දී ශංකරාචාර්ය විසින් ස්වකීය භද්‍රායනගේ වේදාන්ත සූත්‍රවලට කළ අටුවාවෙහි (විඥානාස්තිත්වවාදීන් හෙවත් යෝගාචාර හා සර්ව-ශූන්‍යත්වවාදීන් හෙවත් මාධ්‍යමික යන සම්ප්‍රදායන් සමග) සර්වාස්තිත්ව-වාදීන්

---

සංස්: ආචාර්ය ගොඩගම මංගල හිමි, රාජකීය පණ්ඩිත මාදිපොල විමලජෝති හිමි, "බෞද්ධ හා පාලි අධ්‍යයන" (අතිපූජ්‍ය පලීපාන ශ්‍රී චන්දානන්ද මහානායක මාහිමි ජන්ම ශතසංවත්සර අනුස්මරණ ශාස්ත්‍රීය කලාපය, 2014)